Lesson 24

# ප්‍රශ්න ඇසීම

## Asking Questions

ඉංග්‍රීසි භාෂාවේ ප්‍රශ්න ඇසීම සඳහා භාවිතා කරන ඉතාම වැදගත් වචන 9ක් තියෙනවා. ප්‍රශ්න වචන ලෙස හඳුන්වන්නේ ඒවායි. මින් එකක් හැර අන් සියළු වචන පටන් ගන්නේ 'wh' අකුරු දෙකින්. ඒ නිසා ඒවා ඇතැම්විට 'wh' words ලෙසත් හඳුන්වනවා. අපි බලමු ඒ ප්‍රශ්න වචන මොනවද කියලා

What - වට් - මොකක්ද?
Why - වයි - ඇයි?
When - වෙන් - කවදද- කීයටද?
Where - වෙයා - කොහෙද?
Which - විච් - කොයිකද?
Whom - හූම් - කාටද, කාවද?
Whose - හූස් - කාගෙද?
Who - හූ - කව්ද?
How - හව් - කොහොමද?

මේ වචන ඉංග්‍රීසි භාෂාවේ වාක්‍යයක යෙදෙන යම්කිසි ව්‍යාකරන නීතියක් තියෙනවා. ඒ පිළිවෙලට තමයි ප්‍රශ්න වචනය යොදල වාක්‍යය තැනිය යුත්තේ

- ❖ ඒ නීතිය තමයි ප්‍රශ්න වචනයක් යෙදෙන්නේ වාක්‍යයක ප්‍රශ්නාර්ථ රූපයට ඉදිරියෙන් කියන එක.

මේ උදාහරණය ගනිමු.

- මොකටද ඔයා කැමති?

ඉස්සෙල්ලාම ඔයා කැමතියි කියන වාක්‍යය ගනිමු

You like.

දැන් එහි ප්‍රශ්නාර්ථ රූපය.

Do you like ?

දැන් ප්‍රශ්න වචනය යොදා සම්පූර්ණ අර්ථය එන ලෙස වාක්‍යය සකසමු.

What do you like?
වට් ඩූ යූ ලයික් ?
ඔයා මොකටද කැමති ?

තවත් උදාහරණ බලමු

- කීයටද ඔයා යන්නේ ?

    ඔයා යනවා - you go

    ඔයා යනවද ? - Do you go ?

    කීයටද - when

    කීයටද ඔයා යන්නේ ? - When do you go ?

හොදයි, මීළඟට අපි එකම ප්‍රශ්නෙකට වෙනස් ප්‍රශ්නාර්ථ වචන කිහිපයක් යොදා ප්‍රශ්න හදමු

අපිට පුළුවන් you go ... කියන වාක්‍යය ගන්න. එහි ප්‍රශ්නාර්ථය Do you go ? දැන් ඒ ප්‍රශ්නයට විවිධ ප්‍රශ්න වචන යොදා ප්‍රශ්න තනමු

- ඇයි ඔයා යන්නේ ?

    Why do you go ?
    වයි ඩූ යූ ගෝ ?

- කොහෙද ඔයා යන්නේ ?

    Where do you go ?
    වෙයා(ර්) ඩූ යූ ගෝ ?

- කොහොමද ඔයා යන්නේ ?

    How do you go ?
    හව් ඩූ යූ ගෝ ?

ඊළගට මේ ප්‍රශ්නය ගනිමු

- කොහෙද ඔයා ගියේ ?

ඔයා ගියා - you went - මෙය අතීත කල වාක්‍යයක්. මීලගට මෙය ප්‍රශ්නාර්ථ ස්වරූපයට පෙරලමු .

ඔයා ගියාද ?- Did you go ? (මෙය අතීත කාලයේ ප්‍රශ්නයක්. අතීත කාල ක්‍රියා වල ප්‍රශ්නාර්ථ රූපය ඔබට මතක ඇති ? )

- කොහෙද ඔයා ගියේ ?

  Where did you go ?
  වෙයා(ර්) ඩිඩ් යූ ගෝ ?

- කීයටද ඔයා ගියේ ?

  When did you go ?
  වෙන් ඩිඩ් යූ ගෝ ?

- ඇයි ඔයා ගියේ ?

  Why did you go ?
  වයි ඩිඩ් යූ ගෝ ?

- කොහොමද ඔයා ගියේ ?

  How did you go ?
  හව් ඩිඩ් යූ ගෝ /

තවත් උදහරන් කිහිපයක් ගෙන බලමු .

- ඔයා මොනවද කරන්නේ (කරමින් ඉන්නේ ) ? (මෙය වර්තමාන සිදුවෙමින් පවතින ක්‍රියාවක ප්‍රශ්නයක් )

  ඔයා කරමින් ඉන්නවා - you are doing
  ඔයා කරමින් ඉන්නවද ? Are you doing ?

- මොනවද ඔයා කරමින් ඉන්නේ ?

  What are you doing ?
  වට් ආ යූ ඩුයිං ?

- ඇය මොනවා කියයිද ? **(**මෙය අනාගත කාලයේ ප්‍රශ්නයක් )

  ඇය කියාවි - She will say
  ඇය කියාවිද ? - Will she say ?

මොනවා - what

What will she say ?
වට් විල් ෂී සේ ?
ඇය මොනවා කියාවිද ?

- ඇයි ඔයා මට කෝල් කලේ ?

ඔයා මට කෝල් කළා - You called me
ඔයා මට කෝල් කලාද ? - Did you call me ? (මෙය අතීත කාලයේ ප්‍රශ්නයක් )
ඇයි - why

Why did you call me ?
වයි ඩිඩ් යූ කෝල් මී ?
ඇයි ඔයා මට කෝල් කලේ ?

- කොහොමද ඔයා දන්නේ ?

ඔයා දන්නවා - You know
ඔයා දන්නවද ? - Do you know ?
කොහොමද ? - How

How do you know ?
හව් ඩූ යූ නෝ ?
ඔයා කොහොමද දන්නේ ?

- කොහෙදිද ඔයා ඔහුව දැක්කේ ?

ඔයා ඔහුව දැක්කා - You saw him
ඔයා ඔහුව දැක්කද ? - Did you see him (මෙය අතීත කාලයේ ප්‍රශ්නයක් )
කොහෙදිද ? - Where

Where did you see him ?
වෙයා(ර්) ඩිඩ් යූ සී හිම් ?
ඔයා කොහෙදිද ඔහුව දැක්කේ ?

- ඇය මොනවද දවල් කෑමට උයලා තියෙන්නේ ?

ඇය දවල් කෑමට උයලා තියෙනවා - She has cooked for lunch
ඇය දවල් කෑමට උයල තියෙනවද ? - Has she cooked for lunch ? (මෙය කරලා තියෙන ක්‍රියා වල ප්‍රශ්න ස්වරූපය)
මොනවද what

What has she cooked for lunch ?
වට් හැස් ෂී කුක්ඩ් ෆෝ ලන්ච් ?
මොනවද ඇය දවල් කෑමට උයලා තියෙන්නේ ?

- ඕගොල්ලෝ මොනවද කරකර හිටියේ ? ( කරමින් හිටියේ ?)

ඕගොල්ලෝ කරකර හිටියා - You were doing
ඕගොල්ලෝ කරකර හිටියද ? - Were you doing ? (මෙය අතීත කාලයේ කරමින් සිටි ක්‍රියා වල ප්‍රශ්නය )
මොනවද - what

What were you doing ?
වට් ව(ර්) යූ ඩුයිං ?
මොනවද ඕගොල්ලෝ කරකර හිටියේ ?

- කොහෙද ඔහු ගිහින් තිබුනේ ?

ඔහු ගිහින් තිබුනා - He had gone
ඔහු ගිහින් තිබුනද ? - Had he gone ? (මෙය කරලා තිබුණු ක්‍රියාවක ප්‍රශ්න රූපය )
කොහෙද - Where

Where had he gone ?
වෙයා(ර්) හැඩ් හී ගෝන් ?
කොහෙද ඔහු ගිහින් තිබුනේ ?

හොදයි දැන් ඔබට මේ ගැන යම් අවබෝධයක් ලැබෙන්න ඇති . මෙහිදී විශේෂයෙන්ම සදහන් කරන්න ඕන කාරණය තමයි අපි මේ වෙනකල් ඉගෙන ගෙන තියෙන, ක්‍රියාවන් ප්‍රකාශ කරන සියලුම කාල වල (අපි මේ වෙනකොට එවැනි කාල 7ක් ඉගෙන ගෙන තියෙනවා ) ප්‍රශ්නාර්ථ ස්වරූපය හැදෙන හැටි ගැන අවබෝධයක් තිබෙන්ට ඕන . නැත්නම් නිවැරදිව ප්‍රශ්නයක් ගොඩ නගා ගන්න අමාරුයි . ඒ වගේම ප්‍රශ්නයක් අහන්න ඕන වෙලාවට ඔය වගේ වාක්‍ය එහෙට මෙහෙට පෙරල පෙරලා ඉන්න පුළුවන් කමක් නැහැ . ක්ෂණිකව ඒ වාක්‍යය සාදා ගැනීමේ හැකියාවත් ඔබ වර්ධනය කරගන්න ඕන.ඒ හැකියාව තව ඉදිරියට භාෂාව අධ්‍යනය කරගෙන යනකොට සහ ඔබ ඔබේම වාක්‍යය තනා ගැනීමට උත්සහ දැරීමේදී ඉබේම මෙන් වර්ධනය වේවි.

මීලගට , එක ප්‍රශ්න වචනයක් , එක අදහසක් ගෙන, අපි මෙතෙක් ඉගෙන ගත්තු ක්‍රියා ස්වරූප සියල්ලෙන්ම ඒ ප්‍රශ්නය අසන විදිය එක උදාහරණයකින් ගෙන බලමු . එවිට ඔබට ඒ ඒ ක්‍රියා ස්වරූපයන් වල ප්‍රශ්නාර්තය සෑදෙන විදියත් නැවත මතක් වේවි

What do you do ? - වට් ඩූ යූ ඩූ ? - ඔයා මොනවද කරන්නේ ?
What are you doing ? - වට් ආ යූ ඩූයිං ? - ඔයා මොනවද කරමින් ඉන්නේ ?
What did you do ? - වට් ඩිඩ් යූ ඩූ ? - ඔයා මොනවද කලේ ?
What have you done ? - වට් හැව් යූ ඩන් ? - ඔයා මොනවද කරලා තියෙන්නේ ?
What will you do ? - වට් විල් යූ ඩූ ? - ඔයා මොනව කරාවිද ?
What were you doing ? - වට් ව(ර්) යූ ඩූයිං ? - ඔයා මොනවද කරමින් හිටියේ ?
What had you done ? - වට් හැඩ් යූ ඩන් ? - ඔයා මොනවද කරලා තිබුනේ ?

ඊට අමතරව am ,is ,are වලින් එන වාක්‍යය , ඒ වගේම can වලින් එන වාක්‍යය , මේවයෙත් ප්‍රශ්නාර්ථ රූපය ඉදිරියෙන් තමයි ප්‍රශ්න වචනයක් යෙදෙන්නේ

She is angry
ෂී ඉස් ඇංග්‍රි
ඇයට කේන්තියි

එහි ප්‍රශ්නාර්ථ රූපය

Is she angry ?
ඉස් ෂී ඇංග්‍රි ?

දැන් අපි මෙන්න මේ ප්‍රශ්නය අහමු .

Why is she angry ?
වයි ඉස් ෂී ඇංග්‍රි ?
ඇයි ඇයට කේන්ති ?

Can වලින් එන වාක්‍යයක් ගනිමු

You can do
යූ කැන් ඩූ
ඔයාට කරන්න පුළුවන්

දැන් අපිට අහන්න ඕන “මොනවද ඔයාට කරන්න පුළුවන් ?” කියලා . ඉහත වාක්‍යය ප්‍රශ්න රූපයට හරවමු

Can you do ?
කැන් යූ ඩූ ?

දැන් ලේසියෙන්ම අර ප්‍රශ්නය හදන්න පුලුවන්

What can you do ?
වට් කැන් යූ ඩූ ?
මොනවද ඔයාට කරන්න පුළුවන් ?

හොඳයි, අපි මීලඟට එක් එක් ප්‍රශ්න වචනයට උදාහරන ගෙන බලමු. මෙහිදී ඔබ දැනටමත් ඉගෙනගෙන ඇති අතිත, වර්තමාන, අනාගත කාල වල (tenses) ප්‍රශ්න ස්වරූප ගැන ඔබට හොද අවබෝධයක් ඇති කියලා අපේක්ෂා කෙරෙනවා . එසේ නැත්නම් ඔබට පුළුවන් නැවතත් ඒ සියලුම කාල වල ප්‍රශ්න රූපය හැදෙන ආකාරය ගැන නැවතත් ඒ පාඩම් කියවලා බලන්න

**What:- මොකක්ද ?**

What do you know about him?
වට් ඩූ යූ නෝ අබවුට් හිම්?
මොනවද ඔයා ඔහු ගැන දන්නේ?

What did she say?
වට් ඩිඩ් ෂී සේ?
මොනවද ඇය කිව්වේ?

What do you think about this?
වට් ඩූ යූ තිංක් අබවුට් දිස්?
ඔයා මොනවද මේ ගැන හිතන්නේ?

What have you done?
වට් හැව් යූ ඩන්?
මොනවද ඔයා කරලා තියෙන්නේ ?

What was he doing?
වට් වොස් හී ඩුයිං?
මොනවද ඔහු කර කර හිටියේ?

What will they do?
වට් විල් දේ ඩූ?
ඔවුන් මොනවා කරාවිද?

What do you prefer, tea or coffee?
වට් ඩූ යූ ප්‍රිෆ(ර්), ටී ඕ කොෆි?
ඔයා වැඩියෙන් කැමති මොනවටද? තේ ද? කෝපි ද?

What are you talking about?
වට් ආ (වටා) යූ ටෝකිං අබවුට්?
මොනවා ගැනද ඔයා කතා කරන්නේ?

What are you going to do next ?
වට් ආ(වටා) යූ ගොයිං ටු ඩූ නෙක්ස්ට් ?
එයා මොකක්ද ඊලගට කරන්න යන්නෙ ?

What do you want?
වට් ඩු යූ වෝන්ට්?
ඔයාට මොනවද ඕනෙ?

What do you like to eat?
වට් ඩු යූ ලයික් ටු ඊට්?
ඔයා මොනවද කන්න කැමති?

What does he do?
වට් ඩස් හී ඩූ?
ඔහු මොනවද කරන්නේ?

What does she say?
වට් ඩස් ෂී සේ?
ඇය මොනවද කියන්නේ?

What are they doing there?
වට් ආ දේ ඩුයිං දෙයා(ර්)?
ඔවුන් මොනවද එහෙ කරන්නේ?

What is he drawing in his palm?
වට් ඉස් හී ඩ්‍රෝවිං ඉන් හිස් පාම්?
ඔහු ඔහුගේ අල්ලේ මොකක්ද අඳින්නේ?

What is she cooking?
වට් ඉස් ෂී කුකිං?
ඇය මොනවද උයන්නේ?

What did you tell him?
වට් ඩිඩ් යූ ටෙල් හිම්?
ඔයා ඔහුට මොනවද කිව්වේ?

What did they do there?
වට් ඩිඩ් දේ ඩු දෙයා ?
ඔවුන් එහෙ මොනවද කළේ?

What did she give him?
වට් ඩිඩ් ෂී ගිව් හිම්?
ඇය ඔහුට මොනවද දුන්නේ?

What has she cooked?
වට් හැස් ෂී කුක්ඩ්?
ඇය මොනවද උයලා තියෙන්නේ?

What have they done?
වට් හැව් දේ ඩන්?
ඔවුන් මොනවද කරලා තියෙන්නේ?

What have you brought for me?
වට් හැව් යූ බ්‍රෝට් ෆෝ මී?
ඔයා මට මොනවද අරගෙන ඇවිත් තියෙන්නේ?

What will she say?
වට් විල් ෂී සේ?
ඇය මොනව කියාවිද?

What will they do next?
වට් විල් දේ ඩූ නෙක්ස්ට්?
ඔවුන් ඊළඟට මොනව කරාවිද?

What were you doing there?
වට් ව(ර්) යූ ඩූයිං දෙයා(ර්)?
ඔයා එහෙ මොනවද කරමින් හිටියේ?

What was she making?
වට් වොස් ෂී මේකින්?
ඇය මොනවද හදමින් හිටියේ?

What had he written in his letter?
වට් හැඩ් හී රිටින් ඉන් හිස් ලෙට(ර්)?
ඔහු ඔහුගේ ලිපියේ මොනවද ලියා තිබුණේ?

What can you do about this?
වට් කැන් යූ ඩූ අබවුට් දිස්?
මේ ගැන ඔයාට මොනවද කරන්න පුළුවන්?

What is that?
වට් ඉස් දැට්?
ඒ මොකක්ද?

What is in your bag?
වට් ඉස් ඉන් යුව(ර්) බෑග්?
ඔයාගේ බෑග් එකේ මොනවද තියෙන්නේ?

What shall we do now?
වට් ශැල් වී ඩූ නව්?
අපි දැන් මොනවද කරන්නෙ?

What do you need from the shop?
වට් ඩූ යූ නීඩ් ෆ්‍රොම් ද ෂොප්?
කඩෙන් ඔයාට මොනවද(ගේන්න) ඕනෙ?

What time do you usually wake up?
වට් ටයිම් ඩූ යූ යුෂුවලි වේක් අප් (වේකප්) ?
ඔයා සාමාන්‍යයෙන් මොන වේලාවට නැගිටින්නේ ?

What are you looking for?
වට් ආ යූ ලුකිං ෆෝ?
ඔයා මොනවද හොයන්නේ?

What should I bring?
වට් ශුඩ් අයි බ්‍රිං?
මං මොනවද අරගෙන එන්න ඕනෙ?

What do you want me to do?
වට් ඩූ යූ වෝන්ට් මී ටු ඩූ?
ඔයා මට මොකක්ද කරන්න කියන්නේ? (මෙය හොඳ වාක්‍යයක් )

What did you buy?
වට් ඩිඩ් යූ බයි?
ඔයා මොනවද ගත්තේ (මිලට)?

What are your plans for today?
වට් ආ යූව(ර්) ප්ලෑන්ස් ෆෝ ටුඩේ?
අද ඔයාගේ වැඩපිළිවෙළ මොනවාද?

What did you mean by that?
වට් ඩිඩ් යූ මීන් බයි දැට්?
ඔයා මොකක්ද ඒකෙන් අදහස් කලේ ?

What do you expect from me?
වට් ඩූ යූ එක්ස්පෙක්ට් ෆ්‍රොම් මී?
ඔයා මගෙන් මොනවද බලාපොරොත්තු වෙන්නේ?

What's your problem?
වට්ස් යූව(ර්) ප්‍රොබ්ලම්?
ඔයාගෙ ප්‍රශ්නය මොකක්ද ?

What are you waiting for?
වට් ආ යූ වේටිං ෆෝ?
ඔයා මොකකටද බලන් ඉන්නෙ?

What did you hear?
වට් ඩිඩ් යූ හියර්) ?
ඔයාට මොනවද ඇහුනේ?

What's wrong with this?
වට්ස් රෝං විත් දිස්?
මොකක්ද මේකේ වරද?

What do you want to tell me?
වට් ඩූ යූ වෝන්ට් ටු ටෙල් මී?
ඔයාට මොකක්ද මට කියන්න අවශ්‍ය ?

What do you usually do on weekends?
වට් ඩූ යූ යුෂුවලි ඩූ ඔන් වීකෙන්ඩ්ස්?
ඔයා සාමාන්‍යයෙන් සතිඅන්තේ මොනවද කරන්නේ?

What’s your address?
වට්ස් යුව(ර්) ඇඩ්‍රෙස්?
ඔයාගේ ලිපිනය මොකක්ද?

What can I do for you?
වට් කැන් අයි(කැනයි) ඩූ ෆෝ යූ?
මට ඔයාට වෙනුවෙන් මොකක්ද කරන්න පුළුවන්? ( මෙය නිතරම අහන ප්‍රශ්නයක් යමෙකුට උදව් කරන්න ඉදිරිපත් වීමේදී ." මොනවද මගෙන් කෙරෙන්න ඕන ?" කියන එක ඉන් අදහස් වෙන්නේ )

(මේ අවසන් වාක්‍යය ප්‍රශ්න ඇසීම පිලිබද ඉංග්‍රිසි භාෂාවේ සාමාන්‍ය නීතිය අනුගමනය නොවන අවස්ථාවක්. එවැනි උදාහරන ඉංග්‍රිසි භාෂාවේ තිබෙනවා)

What went wrong ?
වට් වෙන්ට් රෝං ?
මොකක්ද වැරදුනේ ? (go wrong කියන්නේ යමක් වරදිනවා )

මේ තවත් එවැනි උදාහරණ කීපයක්

What happened ?
වට් හැපන්ඩ් ?
මොකක්ද වුනේ ?

What happened here?
වට් හැපන්ඩ් හියු(ර්) ?
මොකක්ද මෙතන වුනේ ?

What’s going on?
වට්ස් ගොයිං ඔන්?
මොකක්ද වෙන්නේ ?

**Why:- ඇයි ?**

Why do you go there?
වයි ඩූ යූ ගෝ දෙයා(ර්)?
ඇයි ඔයා එහෙ යන්නේ?

Why does she go abroad?
වයි ඩස් ෂී ගෝ අබ්‍රෝඩ්?
ඇයි ඇය රට යන්නේ?

Why do they make noise?
වයි ඩූ දේ මේක් නොයිස්?
ඇයි ඔවුන් සද්ද කරන්නේ?

Why do you spend money in vain?
වයි ඩූ යූ ස්පෙන්ඩ් මනී ඉන් වේන්?
ඇයි ඔයා නිකරුණේ සල්ලි වියදම් කරන්නේ?

Why is she crying?
වයි ඉස් ෂී ක්‍රයිං?
ඇයි ඇය අඬමින් ඉන්නේ?

Why are you nodding off?
වයි ආ යූ නොඩිං ඕෆ් ?
ඇයි ඔයා නිදි කිරා වැටෙන්නේ?

Why are they shouting there?
වයි ආ දේ ෂවුටිං දෙයා(ර්)?
ඇයි ඔවුන් එතන කෑගසමින් ඉන්නේ?

Why did you come?
වයි ඩිඩ් යූ කම්?
ඇයි ඔයා ආවේ?

Why did she blame me?
වයි ඩිඩ් ෂී බ්ලේම් මී?
ඇයි ඇය මට දොස් කිව්වේ?

Why did they sell it?
වයි ඩිඩ් දේ සෙල් ඉට්(සෙලිට්) ?
ඇයි ඔවුන් ඒක වික්කේ?

Why have you broken this?
වයි හැව් යූ බ්‍රෝකන් දිස්?
ඇයි ඔයා මේක කඩලා තියෙන්නේ?

Why have they left this here?
වයි හැව් දේ ලෙෆ්ට් දිස් හියා(ර්)?
ඇයි ඔවුන් මේක මෙතන දාල ගිහින් තියෙන්නේ?

Why was she crying?
වයි වෝස් ෂී ක්‍රයිං?
ඇයි ඇය අඬමින් හිටියේ?

Why were they fighting there?
වයි වර්(ර්) දේ ෆයිටිං දෙයා ?
ඇයි ඔවුන් එතන රණ්ඩු කරමින් හිටියේ?

Why are they absent today?
වයි ආ දේ ඇබ්සන්ට් ටුඩේ?
ඇයි අද ඔවුන් නැත්තේ? (පැමිණ නැත්තේ)

Why are you here?
වයි ආ යූ හියර්(ර්) ?
ඇයි ඔයා මෙතන?

Why is it so expensive?
වයි ඉසිට් සෝ එක්ස්පෙන්සිව්?
ඇයි ඒක එච්චර ගණන්?

Why can't you come?
වයි කාන්ට් යූ කම්?
ඇයි ඔයාට එන්න බැරි?

Why can't you do it?
වයි කාන්ට් යූ ඩූ ඉට්?
ඇයි ඔයාට ඒක කරන්න බැරි?

Why do you do that?
වයි ඩූ යූ ඩූ දැට්?
ඇයි ඔයා ඒක කරන්නේ?

Why don't you do that ?
වයි ඩෝන්ට් යූ ඩූ දැට් ?
ඇයි ඔයා ඒක කරන්නෙ නැත්තෙ ?

Why don't you come?
වයි ඩෝන්ට් යූ කම්?
ඇයි ඔයා එන්නේ නැත්තේ?

Why did you lie to me?
වයි ඩිඩ් යූ ලයි ටු මී?
ඇයි ඔයා මට බොරු කිව්වේ?

Why didn't she come?
වයි ඩිඩ්න්ට් ෂී කම්?
ඇයි ඇය ආවෙ නැත්තේ?

Why doesn't he like to go abroad?
වයි ඩසන්ට් හී ලයික් ටු ගෝ අබ්‍රෝඩ්?
ඇයි ඔහු රට යන්න කැමති නැත්තේ?

Why is she crying?
වයි ඉස් ෂී ක්‍රයිං?
ඇයි ඇය අඬන්නේ?

Why has she come?
වයි හෑස් ෂී කම්?
ඇයි ඇය ඇවිත් ඉන්නේ?

Why hasn’t she come?
වයි හැසන්ට් ෂී කම්?
ඇයි ඇය ඇවිල්ලා නැත්තේ?

Why is she angry?
වයි ඉස් ෂී ඇංග්‍රි?
ඇයි ඇයට කේන්ති?

Why are you late?
වයි ආ යූ ලේට්?
ඇයි ඔයා පරක්කු?

Why were you late ?
වයි ව(ර්) යූ ලේට් ?
ඇයි  ඔයා පරක්කු වුනේ ?

Why do you think so ?
වයි ඩූ යූ තිංක් සෝ ?
ඇයි ඔයා එහෙම හිතන්නෙ ?

Why are you laughing?
වයි ආ යූ ලාෆින්?
ඇයි ඔයා හිනා වෙන්නේ ?

Why are you upset?
වයි ආ යූ අප්සෙට්?
ඇයි ඔයා අවිලෙන් ?

Why did you stop talking?
වයි ඩිඩ් යූ ස්ටොප් ටෝකිං ?
ඇයි ඔයා කතා කරන එක නැවැත්තුවේ ?

Why did he leave early?
වයි ඩිඩ් හී ලීව් අ(ර්ලි)?
ඇයි ඔහු වේලාසනින් ගියේ ?

Why didn’t you answer the phone?
වයි ඩිඩන්ට් යූ ආන්ස(ර්) ද ෆෝන්?
ඇයි ඔයා ෆෝන් එකට උත්තර දුන්නේ නැත්තේ?

Why are you ignoring me?
වයි ආ යූ ඉග්නෝරිං මී?
ඇයි ඔයා මාව නොතකා හරින්නේ ? ( ගණන් නොගන්නේ?)

Why is he looking at me like that?
වයි ඉස් හී ලුකින් ඇට් මී ලයික් දැට්?
ඇයි ඔහු මා දිහා එහෙම බලාගෙන ඉන්නේ ?

Why are they laughing at you?
වයි ආ දේ ලාෆින් ඇට් යූ?
ඇයි ඔවුන් ඔයාට හිනාවෙන්නේ?

Why is she still awake?
වයි ඉස් ෂී ස්ටිල් අවේක්?
ඇයි ඇය තවම ඇහැරිලා ඉන්නේ?

Why are you in a hurry?
වයි ආ යූ ඉන් අ හරී ?
ඇයි ඔයා හදිස්සියක ?

Why are you always tired?
වයි ආ යූ ඕල්වේස් ටය(ර්)ඩ්?
ඇයි ඔයාට හැම තිස්සෙම මහන්සි ?

Why did you change your plan?
වයි ඩිඩ් යූ චේන්ජ් යුව(ර්) ප්ලෑන්?
ඇයි ඔයා ඔයාගේ සැලසුම වෙනස් කළේ?

Why are you so quiet today?
වයි ආ යූ සෝ ක්වයිට් ටුඩේ?
ඇයි ඔයා අද මෙච්චර නිශ්ශබ්ද?

Why did you take so long?
වයි ඩිඩ් යූ ටේක් සෝ ලෝං?
ඇයි ඔයා එච්චර වෙලා ගත්තේ ? (take long - වෙලා ගන්නවා)

Why do you look worried?
වයි ඩූ යූ ලුක් වොරීඩ් ?
ඇයි ඔයා කනගාටුවෙන් / අවිලෙන් වගේ ?

Why are you calling me now?
වයි ආ යූ කෝලිං මී නව්?
ඇයි ඔයා දැන් මට කෝල් කරන්නේ?

Why aren't you sleeping ?
වයි ආන්ට් යූ ස්ලීපිං ?
ඇයි ඔයා නිදාගන්නේ නැත්තේ ?

Why didn't you answer the phone ?
වයි ඩිඩ්න්ට් යූ ආන්ස(ර්) ද ෆෝන් ?
ඇයි ඔයා ෆෝන් එක ආන්සර් නොකළේ ?

Why don't you trust me ?
වයි ඩෝන්ට් යූ ට්‍රස්ට් මී ?
ඇයි ඔයා මාව විශ්වාස නොකරන්නේ ?

Why are they getting late ?
වයි ආ දේ ගෙටිං ලේට් ?
ඇයි ඔවුන් පරක්කු වෙන්නේ ?

Why hasn't she cooked anything ?
වයි හැස්න්ට් ෂී කුක්ඩ් එනිතිං ?
ඇයි ඇය මුකුත් උයලා නැත්තේ ?

Why can't you work hard?
වයි කාන්ට් යූ ව(ර්)ක් හාඩ්?
ඇයි ඔයාට මහන්සියෙන් වැඩ කරන්න බැරි?

Why can't she help her parents?
වයි කාන්ට් ෂී හෙල්ප් හ(ර්) පේරන්ට්ස්?
ඇයි ඇයට බැරි ඇගේ දෙමාපියන්ට උදව් කරන්න?

Why is it so expensive?
වයි ඉස් ඉට් (ඉසිට්) සෝ එක්ස්පෙන්සිව්?
ඇයි ඒක එච්චර ගණන්?

Why are the shops closed?
වයි ආ ද ශොප්ස් ක්ලොස්ඩ්?
ඇයි කඩ වහලා?

Why are they absent today?
වයි ආ දේ ඇබ්සන්ට් ටුඩේ?
ඇයි අද ඔවුන් නැත්තේ? (පැමිණ නැත්තේ)

Why do they make noise?
වයි ඩූ දේ මේක් නොයිස්?
ඇයි ඔවුන් සද්ද කරන්නේ?

**When:- කීයටද ? කවදද ?**

When do you go to work?
වෙන් ඩූ යූ ගෝ ටු ව(ර්)ක්?
ඔයා කීයටද වැඩට යන්නේ?

When did you come?
වෙන් ඩිඩ් යූ කම්?
ඔයා කවදද/කීයටද ආවේ?

When did it happen?
වෙන් ඩිඩ් ඉට් හැපන්?
කවදද/කීයටද එය සිදු වුනේ?

When will she come?
වෙන් විල් ෂී කම්?
ඇය කවදා/කීයට ඒවිද?

When is the train ?
වෙන් ඉස් ද ට්‍රේන් ?
කීයටද කෝච්චිය ?

When is the next bus going?
වෙන් ඉස් ද නෙක්ස්ට් බස් ගොයිං?
කීයටද ඊලග බස් එක යන්නේ?

When is your birthday?
වෙන් ඉස් යුව(ර්) බ(ර්)ත්ඩේ?
කවදද ඔයාගේ උපන්දිනේ?

When did you see her ?
වෙන් ඩිඩ් යූ සී හ(ර්) ?
කොයි වේලාවේද ඔයා ඇයව දැක්කේ ?

When are you coming to see us ?
වෙන් ආ යූ කමිං ටු සී අස් ?
ඔයා කවදද අපිව බලන්න එන්නේ ?

When do you come?
වෙන් ඩූ යූ කම්?
කවදද / කීයටද ඔයා එන්නේ?

When do they start work?
වෙන් ඩූ දේ ස්ටාට් ව(ර්)ක්?
ඔවුන් කීයටද වැඩ පටන් ගන්නේ?

When does she go to the market?
වෙන් ඩස් ෂී ගෝ ටු ද මාකට්?
කීයටද/ කවදද ඇය මාකට් එකට යන්නේ?

When are you coming?
වෙන් ආ යූ කමිං?
කවදද / කීයටද ඔයා එන්නේ? (මෙය එදිනෙදා කතා බහේදී නිතර ඇසෙන ප්‍රශ්නයක්)

When did you come?
වෙන් ඩිඩ් යූ කම්?
කවදද / කීයටද ඔයා ආවේ?

When did you last see him?
වෙන් ඩිඩ් යූ ලාස්ට් සී හිම්?
ඔයා අන්තිමට ඔහුව දැක්කේ කවදද? / කීයටද?

When did she call you?
වෙන් ඩිඩ් ෂී කෝල් යූ?
ඇය ඔයාට කතා කලේ කවදද? / කීයටද?

When did she go to the saloon?
වෙන් ඩිඩ් ෂී ගෝ ටු ද සැලූන්?
කීයටද ඇය සැලූන් එකට ගියේ?

When will the meeting start?
වෙන් විල් ද මීටිං ස්ටාට්?
රැස්වීම කීයට පටන් ගනීවිද?

When will he come?
වෙන් විල් හී කම්?
ඔහු කීයට / කවදා එයිද?

When will we meet again?
වෙන් විල් වී මීට් අප් අගේන්?
අපි කවදද ආයිත් හම්බ වෙන්නේ?

When do you usually wake up?
වෙන් ඩූ යූ යුෂුවලි වේක් අප් (වේකප්) ?
ඔයා සාමාන්‍යයෙන් කීයටද නැගිටින්නේ ?

When will the shop open?
වෙන් විල් ද ෂොප් ඕපන්?
කඩේ කීයටද අරින්නේ ?

When will you finish this work?
වෙන් විල් යූ ෆිනිෂ් දිස් ව(ර්)ක්?
ඔයා කීයටද/ කවදද මේ වැඩේ ඉවර කරන්නේ ?

When did he arrive?
වෙන් ඩිඩ් හී අරයිව්?
ඔහු කීයටද/ කවදද ආවේ ?

When is the movie starting?
වෙන් ඉස් ද මූවී ස්ටාටිං?
කීයටද චිත්‍රපටිය පටන් ගන්නේ ?

When are they leaving?
වෙන් ආ දේ ලීවිං ?
කීයටද/කවදාද ඔවුන් පිටත් වෙන්නේ ?

When will the bus arrive?
වෙන් විල් ද බස් ඇරයිව්?
බස් එක කීයට එයිද ?

When will she finish cooking?
වෙන් විල් ෂී ෆිනිෂ් කුකිං?
ඇය කීයට උයලා ඉවර කරාවිද?

When did he call you last?
වෙන් ඩිඩ් හී කෝල් යූ ලාස්ට්?
ඔහු ඔයාට අන්තිමට කතා කළේ කවදාද?

When is the next train?
වෙන් ඉස් ද නෙක්ස්ට් ට්‍රේන්?
ඊළඟ දුම්රිය කීයටද ?

When will we leave?
වෙන් විල් වී ලීව්?
අපි කීයටද යන්නේ ?

When is your flight?
වෙන් ඉස් යුව(ර්) ෆ්ලයිට්?
ඔයාගේ ගුවන් යානය කීයටද ?

When will the doctor see me?
වෙන් විල් ද ඩොක්ට(ර්) සී මී?
ඩොක්ටර් මාව කීයට බලයිද ?

When will the exam start?
වෙන් විල් ද එග්සෑම් ස්ටාට්?
විභාගේ පටන් ගන්නේ කීයටද ?

When will you come back home?
වෙන් විල් යූ කම් බැක් හෝම්?
ඔයා ආපහු ගෙදර එන්නේ කීයටද ?

When is the football match?
වෙන් ඉස් ද ෆුට්බෝල් මැච්?
ෆුට් බෝල් මැච් එක කීයටද ?

When is the next meeting?
වෙන් ඉස් ද නෙක්ස්ට් මීටිං?
ඊලග රැස්වීම කවදද?

When is your birthday?
වෙන් ඉස් යුව(ර්) බ(ර්ත් ඩේ?
ඔයාගේ උපන් දිනේ කවදද?

**Where:- කොහෙද ?**

Where did you go?
වෙයා ඩිඩ් යූ ගෝ?
ඔයා කොහේද ගියේ?

Where has she gone?
වෙයා හෑස් ෂී ගෝන්?
ඇය කොහේද ගිහින් තියෙන්නේ?

Where did you put the cap of this bottle?
වෙයා ඩිඩ් යූ පුට් ද කැප් ඔෆ් දිස් බොටිල්?
ඔයා මේ බෝතලේ මූඩිය කොහේද තිබ්බේ?

Where did you meet him?
වෙයා ඩිඩ් යූ මීට් හිම්?
කොහේදිද ඔයාට ඔහුව හමුවුනේ?

Where do they live now?
වෙයා ඩූ දේ ලිව් නව්?
ඔවුන් දැන් කොහේද ඉන්නේ?(ජීවත් වෙන්නේ)

Where is he now?
වෙයා ඉස් හී නව්?
ඔහු දැන් කොහේද?

Where are you from?
වෙයා ආ යූ ෆ්‍රොම් ?
ඔයා කොහේ ඉඳලද? (මෙය බොහෝ විට කෙනෙකුගේ ගම පළාත ඇසීමේදී භාවිතා වෙනවා)

Where shall we meet up ?
වෙයා ශෑල් වී මීට් අප් ?
අපි කොහෙදිද හම්බ වෙන්නේ ?

Where did you see him ?
වෙයා ඩිඩ් යූ සී හිම් ?
ඔයා කොහෙදිද ඔහුව දැක්කේ ?

Where do you go on Sundays?
වෙයා ඩූ යූ ගෝ ඔන් සන්ඩේස්?
ඔයා ඉරිදට කොහෙද යන්නේ?

Where does your father work?
වෙයා ඩස් යුව(ර්) ෆාදර් ව(ර්)ක්?
ඔයාගේ තාත්තාව කොහේද වැඩ කරන්නේ?

Where do you want to go?
වෙයා ඩූ යූ වොන්ට් ටු ගෝ?
ඔයාට කොහේටද යන්න ඕනේ?

Where are they going now?
වෙයා ආ දේ ගොයිං නව්?
ඔවුන් දැන් කොහෙද යන්නේ?

Where are you sitting?
වෙයා ආ යූ සිටිං?
ඔයා කොතනද වාඩි වෙලා ඉන්නේ?

Where is she selling her flowers?
වෙයා ඉස් ෂී සෙලිං හ(ර්) ෆ්ලව(ර්)ස්?
ඇය කොහේද ඇගේ මල් විකුණන්නේ?

Where did you go last Sunday?
වෙයා ඩිඩ් යූ ගෝ ලාස්ට් සන්ඩේ?
ඔයා ගිය ඉරිදා කොහෙද ගියේ?

Where did you see her?
වෙයා ඩිඩ් යූ සී හ(ර්)?
ඔයා කොහේදිද ඇයව දැක්කේ?

Where did you leave my umbrella?
වෙයා ඩිඩ් යූ ලීව් මයි අම්බ්‍රෙල්ලා?
ඔයා කොහෙද මගේ කුඩේ දාල ආවේ?

Where did you buy this?
වෙයා ඩිඩ් යූ බයි දිස්?
කොහෙන්ද ඔයා මේක ගත්තේ?

Where has she gone?
වෙයා හැස් ෂී ගෝන්?
ඇය කොහෙද ගිහින් තියෙන්නේ?

Where have they put my books?
වෙයා හැව් දේ පුට් මයි බුක්ස්?
ඔවුන් මගේ පොත් කොහේද තියලා තියෙන්නේ?

Where will we meet tomorrow?
වෙයා විල් වී මීට් ටුමෝරෝ?
අපි හෙට කොහේද හමුවෙන්නේ?

Where will they stay tonight?
වෙයා විල් දේ ස්ටේ ටුනයිට්?
ඔවුන් අද රෑ කොහේද නවතින්නේ?

Where will we sit in the auditorium?
වෙයා විල් වී සිට් ඉන් ද ඔඩිටෝරියම්?
ශ්‍රවනාගාරේ කොතනද අපි ඉඳ ගන්නේ?

Where were you going?
වෙයා ව(ර්) යූ ගොයිං?
ඔයා කොහේද යමින් හිටියේ?

Where was he working yesterday?
වෙයා වෝස් හී ව(ර්)කින් යෙස්ටඩේ?
ඔහු ඊයේ කොහේද වැඩ කරමින් හිටියේ?

Where had they gone?
වෙයා හැඩ් දේ ගෝන්?
ඔවුන් කොහෙද ගිහින් තිබුනේ?

Where had he hidden my bag?
වෙයා හැඩ් හී හිඩ්න් මයි බැග්?
ඔහු මගේ බෑග් එක කොහේද හංගලා තිබුනේ?

Where can I keep this baggage?
වෙයා කැනයි කීප් දිස් බැගේජ්?
මට කොහෙන්ද මේ බෑග් එක තියන්න පුළුවන්?

Where shall I keep this?
වෙයා ශැලයි අයි කීප් දිස්?
මම මේක කොහෙන්ද තියන්නේ?

Where can I wash my hands?
වෙයා කැනයි අයි වොෂ් මයි හැන්ඩ්ස්?
මට කොහෙන්ද අත් හෝද ගන්නේ පුළුවන්?

Where is she now?
වෙයා ඉස් ෂී නව්?
දැන් ඇය කොහෙද?

Where are my books?
වෙයා ආ මයි බුක්ස්?
මගේ පොත් කොහෙද?

Where is your school?
වෙයා ඉස් යුව(ර්) ස්කූල්?
ඔයාගේ පාසල කොහෙද?

Where are you going for lunch?
වෙයා ආ යූ ගොයිං ෆෝ ලංච්?
ඔයා ලංච් එකට කොහෙද යන්නේ?

Where did you park the car?
වෙයා ඩිඩ් යූ පාක් ද කා(ර්)?
ඔයා කාර් එක කොහේද පාක් කලේ ?

Where is the nearest pharmacy?
වෙයා ඉස් ද නියරස්ට් ෆාමසි?
ලඟම ෆාමසිය කොහේද තියෙන්නේ ?

Where do you usually go shopping?
වෙයා ඩූ යූ යුෂුවලි ගෝ ෂොපින්?
ඔයා සාමාන්‍යයෙන් ෂොපින් යන්නේ කොහේද ?

Where did you keep my keys?
වෙයා ඩිඩ් යූ කීප් මයි කීස්?
ඔයා මගේ යතුරු කොහේද තිබ්බේ?

Where did you keep the milk?
වෙයා ඩිඩ් යූ කීප් ද මිල්ක්?
ඔයා කොහේද කිරි තිබ්බේ?

Where are we going this evening?
වෙයා ආ වී ගොයිං දිස් ඊව්නිං?
අපි අද සවස කොහෙද යන්නේ?

Where did you get this dress?
වෙයා ඩිඩ් යූ ගෙට් දිස් ඩ්‍රෙස්?
ඔයා මේ ඇඳුම කොහෙන්ද ගත්තේ?

Where can I buy vegetables?
වෙයා කැනයි අයි බයි වෙජිටබල්ස්?
මට කොහෙන්ද එළවළු මිලදී ගන්න පුළුවන්?

Where are we meeting today?
වෙයා ආ වී මීටිං ටුඩේ?
අපි අද කොහේද හමුවෙන්නේ?

Where did you leave the bag?
වෙයා ඩිඩ් යූ ලීව් ද බෑග්?
ඔයා බෑග් එක කොහේද තියල ගියේ ?

Where is the bank?
වෙයා ඉස් ද බෑන්ක්?
බැංකුව කොහේද?

Where can I find a taxi?
වෙයා කැනයි ෆයින්ඩ් අ ටැක්සි?
මට කොහෙන්ද ටැක්සියක් හොයා ගන්න පුළුවන්?

Where are my keys?
වෙයා ආ මයි කීස්?
මගේ යතුරු කොහේද?

Where have you been?
වෙයා හැව් යූ බීන්?
ඔයා කොහේද හිටියෙ?

Where should I keep the key ?
වෙයා ෂුඩ් අයි කීප් ද කී ?
මම කොහෙද යතුර තියන්න ඕන ?

Where shall I wait until you come ?
වෙයා ෂැලයි වේට් අන්ටිල් යූ කම් ?
ඔයා එනකල් මම කොහෙද ඉන්නේ ?

Where have you been ?
වෙයා හැව් යූ බීන් ?
ඔයා කොහේද හිටියෙ ? ( මෙය හොද වාකයයක් )

**Which:-කොයි එකද/මොන එකද?**

Which යෙදෙන කොට නිතරම සංසන්දනයක් තියෙනවා . දෙකකින් හෝ කිහිපයක් අතුරින් මොන එකද/කොයි එකද වැනි අදහසක් එතකොට එන්නේ ? පහත ඇතැම් උදාහරණ වල වරහන් තුල දී තිබෙන්නේ ඒ ප්‍රශ්නය ඇසීමට පසුබිම් වූ තත්වය )

- Which යෙදන විට එයින් සෑම විටම අදහස් වෙනවා දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර සංසන්දනයක්

Which one is the best?
විච් වන් ඉස්ද බෙස්ට්?
කොයි එකද හොඳම?

Which do you like most?
විච් ඩූ යූ ලයික් මෝස්ට්?
කෝකටද ඔයා වැඩියෙන්ම කැමති?

Which girl do you mean?
විච් ග(ර්)ල් ඩූ යූ මීන් ?
කොයි ගෑනු ළමයාද ඔයා කියන්නේ ? (mean කියන්නේ අදහස් කරනවා කියන එක)

Which shirt do you like? White one or blue one?
විච් ෂ(ර්)ට් ඩූ යූ ලයික්? වයිට් වන් ඕ බ්ලූ වන්?
කොයි ෂ(ර්)ට් එකටද ඔයා කැමති? සුදු එකටද? නිල් එකටද?

Which one do you select ?
විච් වන් ඩූ යූ සිලෙක්ට් ?
කොයි එකද ඔයා තෝරන්නෙ ?

Which one was selected as the best ?
විච් වන් වෝස් සිලෙක්ටඩ් ඈස් ද බෙස්ට් ?
කොයි එකද හොදම එක විදියට තේරුනෙ ?

(There's this blue shirt and this brown one too ) Which do you like ?
(දෙයා(ර්)ස් දිස් බ්ලූ ෂ(ර්)ට් ඇන්ඩ් දිස් බ්‍රවුන් වන් ටූ ) විච් ඩූ යූ ලයික් ? -
(මේ නිලපාට ෂ(ර්)ට් එක තියෙනවා , මේ දුඹුරු පාට එකත් තියෙනවා ) , කොයි එකටද ඔයා කැමති ?

(They have a lot of fruit juices on the menu.) Which one do you like ? -
(දේ හෑව් අ ලොට් ඔෆ්(ලොටොෆ්) ෆ්රුට් ජූසස් ඔන් ද මෙනු) . විච් වන් ඩූ යූ ලයික් ?
(ඒගොල්ලෝ ලග ගොඩක් පලතුරු බීම ජාති තියෙනවා මෙනු එකේ) කොයිකටද ඔයා කැමති?

Which is your car? (This one or that one?)
විච් ඉස්(විචිස්) යුව(ර්) කා ?(දිස් වන් ඕ දැට් වන් ?)
කොයි එකද ඔයාගේ කාර එක ? (මේකද, අරකද ?)

Which do you prefer? (Tea or coffee? )
විච් ඩූ යූ ප්‍රිෆ(ර්) ? (ටී ඕ කොෆී ?)
මොනවටද ඔයා කැමති ? (තේ ද කෝපි ද ?)

Which bag is yours? (The black one or the blue one? )
විච් බෑග් ඉස් යුව(ර්)ස් ? (ද බ්ලැක් වන් ඕ ද බ්ලූ වන් ?)
කොයි එකද ඔයාගේ බෑග් එක ?( කළු එකද , නිල එකද ?)

Which way are you going? (There are two ways )
විච් වේ ආ යූ ගොයිං? ( දෙයාරා ටූ වේස් )
කොයි පාරෙද ඕගොල්ලෝ යන්නේ ? (පාරවල් දෙකක් තියෙනවා )

Which color do you like for the wall?
විච් කල(ර්) ඩූ යූ ලයික් ෆෝ ද වෝල්?
බිත්තිය ට කොයි පාටද ඔයා කැමති ?

Which route should we take to school?
විච් රූට් ශැල් වී ටේක් ටු ස්කූල්?
ඉස්කෝලෙට යන්න අපි කොයි පාරේද යන්නේ?

Which dress are you going to wear for the party tonight?
විච් ඩ්‍රෙස් ආ යූ ගොයිං ටු වෙයා ෆෝ ද පාටි ටුනයිට්?
අද රෑ පාටියට ඔයා කොයි ඇඳුමද අඳින්න යන්නේ ?

Which restaurant do you want to go to?
විච් රෙස්ටුරන්ට් ඩූ යූ වෝන්ට් ටු ගෝ ටු?
කොයි ආපන ශාලාවටද ඔයාට යන්න ඕනෙ?

Which team do you support?
විච් ටීම් ඩූ යූ සපෝට් ?
කොයි කණ්ඩායමටද ඔයා සහය දෙන්නේ?

Which pen should I use to sign ?
විච් පෙන් ශැල් අයි යූස් ටු සයින් ?
මම කොයි පෑනද මම අත්සන් කරන්න පාවිච්චි කල යුත්තේ ?

Which route did you take to work?
විච් රූට් ඩිඩ් යූ ටේක් ටු ව(ර්)ක්?
ඔයා වැඩට ගියේ කොයි පාරේද ?

Which is your seat?
විච් ඉස් යුව(ර්) සීට්?
ඔයාගේ සීට් එක කොයි එකද ?

Which mobile phone do you want to buy?
විච් මොබයිල් ෆෝන් ඩූ යූ වෝන්ට් ටු බයි?
කොයි ජංගම දුරකතනයද ඔයාට මිලදී ගන්න අවශ්‍ය ?

Which dress is hers?
විච් ඩ්‍රෙස් ඉස් හ(ර්ස්?
ඇයගේ ඇඳුම කොයි එකද ?

Which seat shall we take?
විච් සීට් ශැල් වී ටේක්?
අපි කොයි ආසනය ද ගන්නෙ?

Which day is suitable for the meeting?
විච් ඩේ ඉස් සූටබල් ෆෝ ද මීටිං?
කොයි දිනේද රැස්වීමට සුදුසු ?

Which flavor do you prefer?
විච් ෆ්ලේව(ර්) ඩූ යූ ප්‍රිෆ(ර්)?
කොයි රසයටද ඔයා වඩා කැමති?

Which train should we take?
විච් ට්‍රේන් ෂුඩ් වී ටේක්?
අපි කොයි දුම්රියද ගන්න ඕන ?

Which book are you reading?
විච් බුක් ආ යූ රීඩිං?
ඔයා කොයි පොතද කියවන්නේ?

Which is heavier, (this or that ) ?
විච් ඉස් හෙවිය(ර්), දිස් ඕ  දැට්?
කොයි එකද බර වැඩි , මේකද ? අරකද ?

Which street leads to the park?
විච් ස්ට්‍රීට් ලීඩ්ස් ටු ද පාක්?
කොයි වීදියද පාක් එකට යොමුවෙන්නේ ?

Which team won the match?
විච් ටීම් වොන් ද මැච්?
මොන කණ්ඩායමද මැච් එක දිනුවේ ?

Which hotel is nearest to the airport?
විච් හොටෙල් ඉස් නියරස්ට් ටු ද එය(ර්පෝට්?
ගුවන් තොටුපළට ලංගම කොයි හෝටලයද ?

Which doctor do you want to see?
විච් ඩොක්ට(ර්) ඩූ යූ වෝන්ට් ටු සී?
කොයි වෛද්‍යවරයාවද ඔයාට හමුවෙන්න අවශ්‍ය ?

Which bus stop is closer?
විච් බස් ස්ටොප් ඉස් ක්ලෝස(ර්) ?
කොයි  බස් නැවතුමද වඩා ළඟ ?

Which book do you want?
විච් බුක් ඩූ යූ වොන්ට්?
ඔයාට කොයි පොතද ඕන?

Which girl do you mean?
විච් ග(ර්)ල් ඩූ යූ මීන්?
කොයි ගෑනු ළමයද ඔයා කියන්නේ?

Which subject are you studying now?
විච් සබ්ජෙක්ට් ආ යූ ස්ටඩීං නව්?
ඔයා දැන් කොයි විෂයද අධ්‍යයනය කරන්නේ?

Which dress will you wear for the ceremony?
විච් ඩ්‍රෙස් විල් යූ වෙයා ෆෝ ද සෙරමනි?
උත්සවයට කොයි ඇඳුමද ඔයා අඳින්නේ?

Which is the best one?
විච් ඉස් ද බෙස්ට් වන්?
කොයි එකද හොඳම එක?

පහත මේ වාක්‍යය තුන ප්‍රශ්න සෑදීමේ ඉංග්‍රීසි භාෂාවේ සාමාන්‍ය රීතිය අනුගමනය නොකරන වාක්‍යය දෙකක් . බලන්න එහි වෙනස ඔබට අවබෝධ කරගන්න පුලුවන්ද කියල

Which shop sells this item?
විච් ෂොප් සෙල්ස් දිස් අයිටම්?
කොයි ෂොප් එකද මෙම භාණ්ඩය විකුනන්නේ ?

Which hand is hurting?
විච් හැන්ඩ් ඉස් හ(ර්)ටිං?
කොයි අතද  රිදෙන්නේ ?

Which team will win the match?
විච් ටීම් විල් වින් ද මැච්?
කොයි කණ්ඩායම මැච් එක දිනයිද ?

තවත් ප්‍රශ්න වචන සදහා උදාහරණ ඊලග පාඩමේදී බලමු. එතෙක් මේ සියලුම ප්‍රශ්න වචන සදහා දී ඇති උදාහරණ වාක්‍යය හොදින් අධ්‍යනය කරන්න

Lesson 24

## Spoken English

මේ පාඩමේ තියෙන්නේ සරල කතාබහක්. බොහොවිට අපි වැඩකරන පරිසරයේ මෙවැනි කතාබහ බොහෝ සුලබයි. මේ සංවාද තුලින් අදහස්  කරන්නේ සාමාන්‍ය ඉංග්‍රීසි කතාබහ කෙරෙහි ඔබ තුල ක්‍රමක්‍රමයෙන් හුරුවක් ඇතිකරවන්න. මේ වාක්‍යවල ව්‍යාකරණ සැකැස්ම පිළිබඳ අවදානය යොමු කරන්න. මේවායෙදි හමුවන වැදගත් වාක්‍ය සහ වාක්‍ය ඛන්ඩ හොදින් මතක තබාගෙන ප්‍රායෝගිකව භාවිතා කරන්න හුරුවෙන්න

A :- Are you  going out ?
ආ යූ ගොයින් අවුට් ?
ඔයා එලියට යනවද ?

B :- Yes I am going to the shop  in front of the office
යස්, අයෑම් ගොයිං ටු ද ශොප් ඉන් ෆ්‍රන්ට්  ඔෆ් දි ඔෆිස්
ඔව්, මම ඔෆිස් එක ඉස්සරහ තියෙන ශොප් එකට යනවා

A :- Can you do me a favour, please
කැන් යූ ඩූ මී අ ෆේව(ර්), ප්ලීස් ?
ඔයාට පුලුවන්ද මට උදව්වක් කරන්න, කරුණාකරලා ? (favour - ෆේව(ර්) - උදව්ව)

B :- Sure, What can I do for you ?
ෂුව(ර්), වට් කැන් අයි(කැනයි) ඩූ ෆෝ යූ ?
සහතිකවම, මොනවද මට ඔයා වෙනුවෙන් කරන්න පුලුවන් ?

A:- I didn't have time to cook this morning. Can you bring me a lunch packet ?
අයි ඩිඩ්න්ට් හැව් ටයිම් ටු කුක් දිස් මෝනින්. කැන් යූ බ්‍රිං මී අ ලන්ච් පැකට් ?
මට අද උදේ වෙලාව තිබුණේ නෑ උයන්න. ඔයාට පුලුවන්ද මට ලන්ච් පැකට් එකක් ගෙනත් දෙන්න

B :- Sure, That's nothing. I will (I' ll) do it
ෂුව(ර්), දැට්ස් නතිං. අයි විල්(අයිල්) ඩූ ඉට්
සහතිකවම, ඒක සුළු දෙයක්. මම ඒක කරන්නම්

A :- Thanks , Here's the money
තෑංක්ස්, හියර්)ස් ද මනී
ස්තූතියි. මෙන්න සල්ලි

B :- How much is there ?
හව් මච් ඉස් දෙයා(ර් ?
කීයක් තියෙනවාද?

A :- 300. Buy me a packet of chicken fried rice
ත්‍රී හන්ඩ්‍රඩ්. බයි මී අ පැකට් ඔෆ් චිකන් ෆ්‍රයිඩ් රයිස්.
තුන්සීයයි. මට ගන්න චිකන් රයිස් එකක්

B :- How much is one ?
හව් මච් ඉස් වන් ?
එකක් කීයද ?

A:- 1000, And … buy a newspaper with the balance as well
වන් තව්සන්ඩ් … ඇන්ඩ් … බයි අ නිවුස්පේප(ර්) විත් ද බැලන්ස් ඈස් වෙල්
දාහයි . තව ... පත්තරයකුත් ගන්න ඉතුරු සල්ලි වලින් ( මෙත as well කියන එකෙන් අදහස් වෙන්නෙ also – "ත් " කියන එක )

B :- Ok I will (I will buy යන්න කෙටිකර )
ඕකේ. අයි විල්
හරි, මම ගන්නම්

A :- Will you be late to come back ?
විල් යූ බී ලේට් ටු කම් බැක් ?
ඔයා පරක්කු වේවිද ආපහු එන්න ?

B :- No, I don't think so. I will (I'll) be back within 20 minutes
නෝ. අයි ඩෝන්ට් තිංක් සෝ. අයි විල් (අයිල්) බී බැක් විතින් ට්වෙන්ටි මිනිට්ස්
නෑ . මම හිතන්නේ නෑ එහෙම. මිනිත්තු 20ක් ඇතුලත මම ආපහු ඒවි

A :- That’s Ok ,Thank you
දැට්ස් ඕකේ. තෑංක් යූ
එහෙනම් කමක් නෑ. ස්තූතියි

B:- Is there anything else to buy for you ?
ඊස් දෙයා එනිතින් එල්ස් ටු බයි ෆෝ යූ ?
තව මොනවා හරි තියෙනවද ඔයාට(ඔයා වෙනුවෙන්) ගන්න ?

A:- That’s all I need for now
දැට්ස් ඕල් අයි නීඩ් ෆෝ නව්
දැනට මට එච්චරයි ඕන

B:- If chicken fried rice isn’t available , what else would you like to eat ?
ඉෆ් චිකන් ෆ්‍රයිඩ් රයිස් ඉස්න්ට් අවේලබල් ,වට් එල්ස් වුඩ් යූ ලයික් ටු ඊට් ?
චිකන් ෆ්‍රයිඩ් රයිස් නැත්නම් වෙන මොනවද ඔයා කන්න කැමති ?

A:- Then , buy anything that’s available
දෙන් , බයි එනිතින් දැට්ස් අවේලබල්
එහෙනම් තියෙන ඕන දෙයක් ගන්න
(Anything that’s available - තියෙන ඕන දෙයක්. මෙතන ව්‍යාකරන රටාවක් තියෙනවා. මේ පිලිබද ඔබට Relative pronoun කියන පාඩමෙන් ඉගෙන ගත හැකියි )

Calling after 20 minutes - මිනිත්තු 20 කට පසු ඇමතුමක් ගනිමින් ....

B; Hi , the rice shop is closed today. I had to walk about one kilometer to this shop near the post office
හායි, රයිස් ෂොප් ඉස් ක්ලෝස්ඩ් ටුඩේ. අයි හෑඩ් ටු වෝක් අබවුට් වන් කිලෝමීට(ර්) ටු දිස් ෂොප් නිය(ර්) ද පෝස්ට් ඔෆිස්
අද බත් කඩේ වහලා, මට ඇවිදන් එන්න උනා පෝස්ට් ඔෆිස් එක ඉස්සරහ තියෙන මේ කඩේට

A; Oh… I am sorry, you had to walk that far because of me
ඕ ... අයැම් සොරි, යූ හෑඩ් ටු වෝක් දැට් ෆා බිකෝස් ඔෆ් මී
අයියෝ ... ඔයාට මං නිසා එච්චර දුර ඇවිදින්න වුන එකට
(far - දුර. that far - එච්චර දුර)

B: Oh, that’s nothing . But they have finished chicken fried rice . They only have chicken biriyani . Shall I buy a chicken biriyani for you ?
ඔහ්, දැට්ස් නතිං. බට් දේ හෑව් ෆිනිෂ්ඩ් චිකන් ෆ්‍රයිඩ් රයිස් . දේ ඔන්ලි හෑව් චිකන් බිරියනි. ෂැල් අයි(ෂැලයි) බයි අ චිකන් බිරියානි ෆෝ යූ ?
ආ , ඒක ගානක් නෑ . නමුත් ඒගොල්ලන්ගේ චිකන් ෆ්‍රයිස් රයිස් ඉවර වෙලා ඒගොල්ල ගාව තියෙන්නේ චිචිකන් බුරියානි විතරයි . මම ඔයාට චිකන් බුරියානි එකක් ගන්නද ?

A: How much is it ?
හව් මච් ඉස් ඉට් (ඉසිට් ) ?
කීයද ?

B: 1100
වන් තව්සන්ඩ් වන් හන්ඩ්‍රඩ්
එක්දාස් එකසීයයි

A; Money I gave you won't be enough to buy a biriyani
මනි අයි ගේව් යූ වෝන්ට් බී ඉනෆ් ටූ බයි අ බුරියානි
මම ඔයාට දුන්නු සල්ලි මදි වේවි බුරියානි එකක් ගන්න
(මෙහි money I gave you කියන්නේ money that I gave you කියන එක .
මෙය Relative pronoun පාඩමේ විස්තර කර තිබෙනවා )

B; Oh, don't think about it . I'll (I will) put some(some money) out of my pocket and you can give me back later
ඔහ් ඩෝන්ට් තිංක් අබවුට් ඉට් . අයිල් පුට් සම් අවුට් ඕෆ් මයි පොකට් ඇන්ඩ් යූ කැන් ගිව් මී බැක් ලේට(ර්)
ආ , ඒ ගැන හිතන්න එපා , මම මගේ අතින් ටිකක් දාන්නම් ඔයාට පුළුවන් පස්සේ මට ආපහු දෙන්න (ඔබ ඔබේ අතින් යමකට මුදල් වියදම් කරනවා නම් ඔබ out of your pocket වියදම් කරන්නෙ)

A; Ok, Please do so , I will pay you back as soon as you come back to the office
ඕකේ ,ප්ලීස් ඩූ සෝ , අයි විල් පේ යූ බැක් ඈස් සූන් ඈස් යූ කම් බැක් ටු ද ඔෆිස්
හරි, එහෙම කරන්න , ඔයා ඔෆිස් එකට ආපු ගමන්ම මම ආපහු ගෙවන්නම්

B: It will be about another 20 minutes when I come back . Is that ok ?
ඉට් විල් බී අබවුට් අනද(ර්) ට්වෙන්ටි මිනිට්ස් වෙන් අයි (වෙනයි )කම් බැක් ඉස් දැට් ඕ කේ ?
තවත් මිනිත්තු 20ක් විතර යයි මම ආපහු එනකොට. කමක් නැද්ද ?

A: That doesn't matter, but take a taxi , I will pay for that . You cannot walk in this sun
දැට් ඩස්න්ට් මැට(ර්), බට් ටේක් අ ටැක්සි , අයි විල් පේ ෆෝ දැට්. යූ කැනොට් වෝක් ඉන් දිස් සන්
ඒකට කමක් නැහැ නමුත් ටැක්සි එකක් ගන්න.මම ඒකට ගෙවන්නම් . ඔයාට මේ අව්වේ පයින් එන්න බැහැ

B: A taxi will cost a lot . I'll walk somehow . Don't worry
අ ටැක්සි විල් කොස්ට් අ ලොට් . අයිල් වෝක් සම්හව් . ඩෝන්ට් වොරි
ටැක්සියකට සෑහෙන ගානක් යයි . මම කොහොම හරි පයින් එන්නම්

A: Oh … you are taking lot of trouble for me. I cannot thank you enough
ඕ… යූ ආ ටේකින් ලොටොෆ් ට්‍රබල් ෆෝ මී . අයි කැනොට් තෑන්ක් යූ ඉනෆ්
අනේ … ඔයා මම නිසා සෑහෙන්න කරදර වෙනවා . ඔයාට කොහොම ස්තුති කරන්නද මන්ද ? (ඔයාට ප්‍රමාණවත් තරම් ස්තුති කරන්න මට බැහැ කියන එක සිංහල කට වහරින් කියවෙන්නෙ ඔහොම )

B: Anything for you
එනිතින් ෆෝ යූ
ඔයා වෙනුවෙන් ඕන දෙයක්
(Anything for you -මෙය විශේෂයෙන් තමන්ට බෙහෙවින් සමීප කෙනෙකුට ස්තුතියක් වෙනුවෙන් පල කරන ප්‍රතිචාරයක් )

**Vocabulary 24**

Ignore – ඉග්නෝ – නොතකා හරිනවා

Auditorium – ඔඩිටෝරියම් – රැස්වීම් ශාලාව, ප්‍රේක්ෂකාගාරය

Hide – හයිඩ් – සඟවනවා

Hidden – හිඩ්න් – සඟවා ඇති , සැඟවුණු

Near – නියර්) – ළඟ , ආසන්න

Nearer – නියර(ර්) – වඩා ළඟ

Nearest – නියරස්ට් – ළඟම

Key – කී – යතුර

Route – රූට් – මාර්ගය , පාර

Heavy – හෙවි – බර

Heavier – හෙවිය(ර්) – වඩා බර

Heaviest – හෙවියස්ට් – බරම

Lead – ලීඩ් – මඟ පෙන්වනවා

Street – ස්ට්‍රීට් – වීදිය , පාර

Subject – සබ්ජෙක්ට් – විෂය

In front of … – ඉන් ෆ්‍රන්ට් ඔෆ් … – …. ඉදිරියේ

Favour – ෆේව(ර්) – අනුග්‍රහය, උදව්ව

Balance – බැලන්ස් – සමතුලිතතාව

pocket -පොකට් - පසුම්බිය

Suitable – සූටබල් – සුදුසු

Unsuitable – අන්සූටබල් – නුසුදුසු

Select – සිලෙක්ට් – තෝරාගන්නවා

Palm – පාම් – අල්ල

Abroad – අබ්‍රෝඩ් – විදේශයේ , විදේශගතව

Go abroad – ගෝ අබ්‍රෝඩ් – විදේශගත වෙනවා , පිටරට යනවා

Blame – බ්ලේම් – දෝෂාරෝපණය කරනවා , බනිනවා

Prefer – ප්‍රිෆ(ර්) – වඩා කැමති වෙනවා

Usually – යුෂුවලි – සාමාන්‍යයෙන්

Coffin – කොෆින් – මිනී පෙට්ටිය

Cogwheel – කොග්වීල් – දැති රෝදය

Collapse – කලැප්ස් – කඩා වැටෙනවා, බිඳ වැටෙනවා / කඩා වැටීම

Combat – කොම්බැට් – සටන

Comical – කොමිකල් – හාස්‍යජනක

Command – කමාන්ඩ් – අණ / අණ කරනවා

Coma – කෝමා – සිහි නැති දිගු නින්ද , දිගු සිහි මූර්ජාව

Commercial – කම(ර්)ෂල් – වාණිජ, වෙළඳ

Diabetes – ඩයබිටීස් – දියවැඩියාව

Diabetic – ඩයබෙටික් – දියවැඩියා රෝගියෙක්, දියවැඩියාවට අදාළ

Digest – ඩයිජෙස්ට් – ජීර්ණය කරනවා

Digestion – ඩයිජෙස්චන් – ජීර්ණය

Digit – ඩිජිට් – අංකය

Dignity – ඩිග්නිටි – ගෞරවය, අභිමානය

Dim – ඩිම් – අඳුරු, මඳ ආලෝකයක් ඇති

Dimple – ඩිම්පල් – කම්මුලේ වල